6/S/BU/1/ELM

ආගම් හා සාරධර්ම අධ්‍යාපනය

# බුද්ධ ධර්මය

## පළමු වාරය

## මොඩියුල අංක 1 සහ 2

## ගුරු මාර්ගෝපදේශය

# 6 ශ්‍රේණිය



ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාපීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
**www.nie.ac.lk**
මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ආගම් හා සාරධර්ම අධ්‍යාපනය

# බුද්ධ ධර්මය

## මොඩියුල අංක 1 සහ 2

## ගුරු මාර්ගෝපදේශය

### පළමු වාරය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාපීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
**www.nie.ac.lk**

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ආගම් හා සාරධර්ම අධ්‍යාපනය - බුද්ධ ධර්මය - 6 ශ්‍රේණිය

පළමු වාරය - මොඩියුල අංක 1 සහ 2

ප්‍රථම මුද්‍රණය - 2026

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි

ISBN -

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාපීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.ac.lk**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු විසින්
..........................................................................
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

Published by: Educations Publications Department
Printed by :.......................................................

# අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම් ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21 වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශවකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි.

මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආතකනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්‍ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියා ව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයයන් නවීකරණය වන අතර ම නව විෂයයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුලය බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. විසිඑක් වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාවන් සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ආචාර්ය උපාලි සේදර, ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න හා මහාචාර්ය ප්‍රසාද් සේතුංග යන මහත්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අත්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාපීඨය
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

# අධ්‍යක්ෂ පණිවුඩය

ආගම් හා සාරධර්ම අධ්‍යාපනය මගින් ඵලදායී ජීවිතයක් පවත්වා ගැනීමට උපකාරී වන පරිදි මෙම මොඩියුලය සකස් කර ඇත. පාසල් අධ්‍යාපනය පසුබිම් කොට ගත් අත්‍යවශ්‍ය ඉගෙනුම් මූලික කර ගෙන මෙම මොඩියුලය සම්පාදනය කර ඇත. ඒ සඳහා පාදක වූයේ චරිත සංවර්ධනය, සංස්කෘතිය, ශිෂ්ටාචාරය හා සමාජ සංස්කෘතික සංවේදීතාව, පාරිසරික සංවේදීතාව, සාරධර්ම, ආචාරධර්ම හා ප්‍රතිමාන, සතිමත් බව හා සෞඛ්‍ය යහපුරුදු යන සංකල්ප ආගමික විෂය සඳහා පාදක කරගනු ලැබීය.

ආගම් හා සාරධර්ම අධ්‍යාපනයෙහි වටිනාකම කුමක් ද? එහි ප්‍රතිමාන හා සම්මතයන් මත පදනම් ව ඉගැන්වීම් හා ඉගෙනුම් අරමුණු සහ ඉගෙනුම් අත්දැකීම් මොනවා ද? එයට සම්බන්ධ අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප මොනවා ද? වර්තමාන ලෝකයට අනුවර්තනය වීම සඳහා අවශ්‍ය කුමන ආකාරයේ කුසලතාවන් ද? වැනි මූලික ප්‍රශ්න සඳහා විසඳුම් ලබා දීම මෙම විෂයේ ප්‍රධාන පරමාර්ථයයි. ආගමික අධ්‍යාපනයේ වටිනාකම් යනු සාමාන්‍ය අධ්‍යාපනයක මූලික ගුණාංගයකි. අධ්‍යාපනික, වෘත්තීය, පෞද්ගලික හා සාමාජයීය ආදි විවිධ අංශ සඳහා එමගින් සුදුසුකම් ලබා දෙයි.

මෙම මොඩියුලය අධ්‍යයනයේ දී ගුරුවරුන්ගේ, දෙමාපියන්ගේ හා වැඩිහිටියන්ගේ මගපෙන්වීම හා සහයෝගය ලබා ගත යුතු අතර, ඔවුන්ගේ අධීක්ෂණය හා නියාමනය යටතේ සිදු කිරීමට අධ්‍යයන පහසුකම් සලසා ඇත.

ආගම් හා සාරධර්ම අධ්‍යාපනයේ විෂයමාලාව, සමාජයට ඉවසීම මෙන්ම අනාගත අභියෝග වෙත උද්යෝගයෙන් සහ ධෛර්ය සම්පන්නව මුහුණදීමට හැකියාව ඇති නවෝත්පාදන හැකියාවක් ඇති පුද්ගලයකු අපි බලාපොරොත්තු වෙමු.

**මොඩියුල අංක 01 භාවිතය සඳහා උපදෙස්**
**තක්සේරු කරන ක්‍රමවේදය**
පාසල් පාදක ඇගයීම් මත සිදු කෙරේ. එහිදී මොඩියුල අධ්‍යයනය කරන විට සම්භවන ඇගයීම හා තක්සේරු කිරීමත්, මොඩියුලය අවසානයේ දී සම්පිණ්ඩිත ඇගයීමත් සිදු කෙරේ. විස්තරාත්මක ඇගයීම සඳහා රුබ්රික් (Rubric) වගුව තුළින් සාධන මට්ටම මැන ගැනීමට මග පෙන්වයි.

**සම්භාර**
එක් වාරයක් සඳහා මොඩියුලයට සම්භාර දෙකක් පිරිනමනු ලබන අතර එය ශිෂ්‍යයාගේ ඉගෙනුම් පැය 20 ආවරණය ඇතුළත ශිෂ්‍යයාගේ කාර්ය සාධනය ඇගයීම වෙනුවෙන් පිරිනමනු ලබයි.

**දර්ශනපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
අධ්‍යක්ෂ,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

# ජාතික පොදු අරමුණු

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායකවන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායකවන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

## ජාතික ඉගෙනුම් නිපුණතා ක්ෂේත්‍ර
## National Learning Competencies Domain

1. විෂය/න්‍යායාත්මක දැනුම
2. ප්‍රායෝගික දැනුම සහ කුසලතා
3. සන්නිවේදනය
4. කණ්ඩායම් හැඟීම සහ නායකත්වය
5. නිර්මාණශීලිත්වය සහ ගැටලු විසඳීම
6. කළමනාකරණ සහ ව්‍යවසායකත්ව කුසලතා
7. තොරතුරු භාවිතය සහ කළමනාකරණ
8. ජාලකරණය සහ සමාජ කුසලතා
9. අනුවර්තනය වීමේ හැකියාව සහ නම්‍යශීලී බව
10. ආකල්ප වටිනාකම් සහ වෘත්තිකභාවය
11. ජීවිතය සඳහා දැක්ම
12. ස්වයං/ජීවිත කාලය පුරාම ඉගෙනීම යාවත්කාලීන කිරීම

## උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය** : මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

: ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
අධ්‍යක්ෂ, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය** : ජී. ආර්. එම්. ඒ. ගම්ලත් මයා
කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය ඩී.කේ.එස්. භාග්‍යා කන්කානම්ගේ මෙනවිය
කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**සම්පත් දායකත්වය** : ජී. ආර්. එම්. ඒ. ගම්ලත් මයා (විෂය ප්‍රධාන)
(අභ්‍යන්තර) කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**සම්පත් දායකත්වය (බාහිර)**

පූජ්‍ය උලහිටියාවේ විභාවි හිමි - බප/ජය/මහරගම මධ්‍ය මහා විද්‍යාලය,

ඒ. ඒ. බී. එස්. ජිනදාස මයා - ර/අඟාගල සුගත බුද්ධි විද්‍යාලය

**සංස්කරණය (අභ්‍යන්තර)**
ජී. ආර්. එම්. ඒ. ගම්ලත් මයා

**පරිගණක යතුරු ලියනය**
ඒ. ඒ. බී. එස්. ජිනදාස

**සෝදුපත් බැලීම**
පූජ්‍ය උලහිටියාවේ විභාවි හිමි

**විවිධ සහාය**
එස්. සී. ප්‍රියදර්ශනී මිය
එල්. හංසිකා උපමාලි මිය
ඩී. අමරසිංහ මයා

**මොඩියුලය භාවිතය සඳහා උපදෙස්.....**

- මෙම මොඩියුලය 6 ශ්‍රේණිය පළමු වාරය බුද්ධ ධර්මය විෂයට අදාළ ව 21 වන සියවසේ කුසලතා අධ්‍යාපන පාදක ඉගනුම් ඉගැන්වීම් පාසල තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ශිෂ්‍යයාට මඟ පෙන්වයි.
- මොඩියුලය අධ්‍යයනය කරන විට ශිෂ්‍යයා පන්ති කාමරයේ දී හා පන්ති කාමරයෙන් පිටත දී ගුරුතුමාගේ හෝ වැඩිහිටියකුගේ හෝ මගපෙන්වීම සහිත ව හෝ තනි ව ම විවිධ ඉගෙනුම් අවස්ථා නිර්මාණය කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- විෂය අන්තර්ගත ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සහ ඇගයීම සිදු කරන විට ජාතික ඉගෙනුම් නිපුණතා දොළහ (12) ළඟා කර ගැනීම සඳහා සිසුන් යොමු කරන්න.
- එම ඉගෙනුම් නිපුණතා තුළින් ජාතික පොදු අරමුණු 8 ළඟා කර ගැනීමට මග පෙන්වීම තුළින් විසිඑක් (21) වන ශතවර්ෂයේ සිසුවකු නිර්මාණය කර ගැනීමට මග පෙන්වන්න.
- පාඩම් සඳහා දී ඇති අතිරේක පරිශීලන මූලාශ්‍රය හොඳින් අධ්‍යයනයට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. එතුළින් කාලීන තොරතුරු ගවේෂණයටත් දැනුම තවදුරටත් සංවර්ධනය කර ගැනීමට පොළඹවන්න.
- මෙම මොඩියුලයේ අන්තර්ගත පාඩම් සඳහා විවිධ වූ ක්‍රියාකාරකම් ඇත. එම එක් එක් ක්‍රියාකාරකම් හොඳින් අධ්‍යයනය කර උද්යෝගිමත් ව සහ සක්‍රීය ව ශිෂ්‍යයන් ඒවායේ නිරත කරවන්න.
- මෙම මොඩියුලය තුළ කේවල ක්‍රියාකාරකම් මෙන් ම කණ්ඩායම් ක්‍රියාකාරකම් අන්තර්ගත කොට ඇති බැවින් සිසුන් එකමුතු වී සහයෝගයෙන් කටයුතු කිරීමටත්, එකිනෙකා අතර සුහඳ ව අදහස් හුවමාරු කර ගැනීමටත් යොමු කරන්න.
- ක්‍රියාකාරකම අවසානයේ දී සිසුන් ලැබූ අත්දැකීම් යහළුවන් හා ගුරුතුමා/ගුරුතුමිය සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ක්‍රියාකාරකම් අවසානයේ ගුරුතුමා/ගුරුතුමිය විසින් ප්‍රතිපෝෂණය ලබා දිය යුතු අතර හැකියාව වඩාත් ඵලදායී ලෙස සංවර්ධනය කර ගැනීමට මග පෙන්වන්න.
- ආගමික ඉගැන්වීම් සම්බන්ධ ව ඇති ඇතැම් විෂයානුබද්ධ ක්‍රියාකාරකම්වල නිතර වීමට පෙර එම ක්‍රියාකාරකම් පිළිබඳ ව දී ඇති උපදෙස් හොඳින් කියවන්න. අවශ්‍ය අවස්ථාවල ගුරුතුමාගෙන්/තුමියගෙන් හෝ ඒ පිළිබඳ ව මනා දැනුමක්, පළපුරුද්දක් ඇති වැඩිහිටියකුගේ සහාය ලබා ගැනීමට සිසුන්ට මග පෙන්වන්න.
- මොඩියුලයේ දැනුම තහවුරු කර ගැනීම සඳහා එක් එක් පාඩමෙහි ඇති සියලු ම ක්‍රියාකාරකම් අදාළ උපදෙස් අනුව සිදු කරන්න. එක් එක් ක්‍රියාකාරකම් කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය සංකල්ප පිළිබඳ ව ගුරුතුමාගේ/ගුරුතුමියගේ ද උපදෙස් හා උපකාර ලබා දෙමින් අධ්‍යයනයෙහි නිරත කරන්න.
- මෙහි සඳහන් ඇතැම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා නිරීක්ෂණ කාර්යයන් සිදු කිරීමට පාසලෙන් බැහැරට යන අවස්ථාවන්හි දෙමාපියන්ගේ සහාය ලබා ගෙන සංයමයෙන් කටයුතු කරන්න. ඒ පිළිබඳ ව ඇති පාසල් නිතීරීති අනුගමනය කරන්න.

- ක්‍රියාකාරකම්වල නිරත වීමට පෙර ඇතැම් ක්‍රියාකාරකම් සඳහා දී ඇති සුවිශේෂ තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක පිළිබඳ ව ගුරුතුමා/ගුරුතුමිය විසින් සිසුන් දැනුවත් කළ යුතු අතර රූබ්රික් (Rubric) වගුව ඇසුරින් ශිෂ්‍යයාට හිමි ලකුණු සකසා ගන්නා ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

## ක්‍රියාකාරකම් සඳහා පොදු උපදෙස්

- ගුරු මාර්ගෝපදේශයේ ඇති සියලු ම ක්‍රියාකාරකම් හොඳින් කියවන්න.
- ඉගෙනුම් පල හා කර්යසාධන ප්‍රමිති හොඳින් අධ්‍යයනය කරන්න.
- ඉගෙනුම් පල ළඟා කර ගැනීම පිණිස කාර්යසාධන ප්‍රමිතීන්හි නිරත කර වන්න.
- වාස්තවික (විෂයානුබද්ධ) ප්‍රශ්නවලට පිළිතුරු ලබා දී ඇති විට ඇගයීම් සිදු කරන විට සුදුසු ලකුණු ප්‍රදානය කරන්න.
- රචනාමය හෝ විශ්ලේෂණාත්මක පිළිතුරු සඳහා අවශ්‍ය අවස්ථාවල දී (Rubric) වගුව භාවිත කරන්න.
- තක්සේරුව හා ඇගයීම මත පදනම් ව රූබ්රික් (Rubric) වගුව හොඳින් අධ්‍යයනය කරන්න.
- ක්‍රියාකාරකම්වල දී අවශ්‍ය මග පෙන්වීම් සිදු කරන්න.
- ක්‍රියාකාරකම කරන අතරතුර දී සිසුන් හොඳින් නිරීක්ෂණය කර අවශ්‍ය තක්සේරු කටයුතුවල හොඳින් නිරත වන්න.
- ඒ ඒ ඉගෙනුම් පල අනුව දී උපදෙස් අනුගමනය කරමින් සිසුන් හොඳින් තක්සේරු කර දරුවා පැමිණ ඇති සාධන මට්ටම්වලට අනුව ලකුණු ප්‍රදානය කරන්න.
- එය විනිවිදභාවයෙන් සහ අපක්ෂපාතී ව සිදු කරන්න.
- සිසුන් ලබා ගෙන ඇති ලකුණු ලේඛනයක් සකස් කරන්න.
- ඇගයීම අවසානයේ දරුවන් ලැබූ සැබෑ ලකුණ ප්‍රදානය කරන්න.

## කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා පොදු උපදෙස්

- සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් සිසුන් කණ්ඩායම් කරන්න. (1, 2, 3 වශයෙන් ගණන් කර කණ්ඩායම්වලට බෙදීමෙන්, නාම ලේඛනයේ නම් පිළිවෙළට කණ්ඩායම් කිරීමෙන්.........)
- අවශ්‍ය උපදෙස් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත වී සිටින විට තක්සේරු කර ගැනීම සිදු කරන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට සිසුන් පෙළ ගැස්වන්න.
- එක් කණ්ඩායමක් ඉදිරිපත් කළ විට ඒ පිළිබඳ ව අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- පිළිවෙළින් සියලු ම කණ්ඩායම්වලට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සමස්තය ගොනු කර සමාලෝචනය සිදු කර අත්‍යවශ්‍ය ඉගෙනුම් අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට සිසුන් යොමු කරන්න.

## මෙම මොඩියුලය කවුරුන් වෙනුවෙන් ද?

බුද්ධ ධර්මය මොඩියුලය පිළියෙල කර ඇත්තේ බුදු දහමේ වැදගත් ඉගැන්වීම් කෙරෙහි හය ශ්‍රේණියේ සිසුන්ගේ අවධානය යොමු කිරීම සඳහාය. මෙම මොඩියුලයෙන් ත්‍රිත්වයේ බුද්ධ චරිත හා බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ චරිත බුද්ධ දේශනා, බෞද්ධ මූලික ඉගැන්වීම්, බෞද්ධ ඉගැන්වීම් හා සතිමත් බව වැනි දේ අවධාරණය කෙරේ.

**මෙම මොඩියුලය සම්පූර්ණ කිරීමට සිසුන්ට මඟපෙන්වීම සඳහා භාවිත කරන උපදෙස් හා ක්‍රම මොනවාද?**

මෙම මොඩියුලය සපුරාලීම සඳහා සිසුනට මඟ පෙන්වීමේ දී කියවීම, ලිඛිත අභ්‍යාස, සාකච්ඡා, ආදර්ශන (පන්ති කාමරයේදී හෝ ක්‍රියාකාරකම් කරන ස්ථානයේ දී) ආදී විවිධ මාර්ගෝපදේශන ක්‍රම භාවිත කළ හැකිය.

විවිධ ඉගෙනුම් ක්‍රමවේද මගින් ඔබට ව්‍යවහාරික තාක්ෂණ වේදය මොඩියුලය හැදෑරීම සඳහා සිසුනට මග පෙන්විය හැකිය.

උදාහරණ

ගැටළු මත පදනම් වූ ඉගෙනීම (Problem Based Learning) ව්‍යාපෘති මත පදනම් වූ ඉගෙනීම (Project Based Learning) විමර්ශනය මත පදනම් වූ ඉගෙනීම (Inquµry Based Learning) ප්‍රතිඵල මත පදනම් වූ ඉගෙනීම (Outcome Based Learning) මිශ්‍ර ඉගෙනීම (Blended Learning)

**ඉගෙනුම්ලාභියා කේන්ද්‍ර කරගත් ඉගෙනුම් කේන්ද්‍රීය (learning/Centeredness) ක්‍රියාවලිය සිදු කරන්නේ කෙසේද?**

- මෙය ස්වයං මෙහෙයවීමෙන් හදාරන මොඩියුලයකි. එහෙත් එය සිදුවනුයේ ගුරුවරයකුගේ මගපෙන්වීම යටතේය.
- කුඩා සිසු කණ්ඩායම් මොඩියුලය භාවිත කර කාර්යයෙහි යෙදෙන විට ගුරුවරයා ඔවුනට නායකත්වය දෙමින් උපකාර කරයි. මෙහිදී ගුරුවරයා ක්‍රියා කරන්නේ සාම්ප්‍රදායික පන්ති කාමර ගුරුවරයා මෙන් නොවේ. විවිධ කාර්ය සඳහා සිසුන් මෙහෙයවීම, ප්‍රශ්නවලට පිළිතුරු දීම, අභ්‍යාසවලදී පුද්ගල මට්ටමෙන් ප්‍රතිපෝෂණය සැපයීම, පැවරුම් දීම, සාකච්ඡා මෙහෙයවීම, ආකෘති නිර්මාණය ආදිය ඔහුගේ /ඇයගේ භූමිකාවට අයත් වේ.
- උගත යුතු මූලික තොරතුරු මොඩියුලවලින් සැපයේ. තොරතුරු පත්‍රිකා, ආදර්ශන, ඡායාරූප ආදිය මගින් හා අන්තර්ජාලයෙන්ද තොරතුරු ලබාගත හැකියි.
- මොඩියුලය නිර්මාණය කර ඇත්තේ සෑම ශිෂ්‍යයකුට ම බුදුදහම සඳහා අවශ්‍ය

සුවිශේෂ කුසලතා වර්ධනය කිරීමට උපකාර කිරීම සඳහා ය. මොඩියුලය නිර්මාණය කර ඇත්තේ සෑම ශිෂ්‍යයෙකුට ම බුදුදහම සඳහා අවශ්‍ය සුවිශේෂ කුසලතා වර්ධනය කිරීමට උපකාර කිරීම සඳහාය. මොඩියුලය කියවා ලිඛිත අභ්‍යාස කණ්ඩායම් සාකච්ඡා සමීක්ෂණ පැවරුම් පුද්ගලයින් හමුවේ ප්‍රශ්න විචාරීම හා ආශ්‍රිත කුසලතා ප්‍රගුණ කිරීමේදී සිසුහු මේ කුසලතා සංවර්ධනය කර ගනිති.

- අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුහු යම් පමණකට පාසල් හා නිවෙස් පරිසරයට පරිබාහිර ව ක්‍රියාකාරකම්වල නියැලෙති. පැවරුම් හා සාකච්ඡා වැනි සමහර ක්‍රියාකාරකම්වලදි කුඩා කණ්ඩායම් එකට වැඩෙහි නිරත වෙයි.
- එක් එක් ශිෂ්‍යයා / ශිෂ්‍යාව ඕනෑම ගැටළුවක් ගුරුවරයා සමග සාකච්ඡා කරන අතර අසම්පූර්ණ කරන ලද අභ්‍යාස පිළිබඳ ප්‍රතිපෝෂණ කඩිනමින් ලබා ගනියි. (සමාලෝචනය හා අභ්‍යාසය ශිෂ්‍යයා සමඟ සාකච්ඡා කිරීම ප්‍රතිපෝෂණයට ඇතුළත්ය.)

**ගුරුවරයකු කරන්නේ කුමක්ද?**

**ගුරුවරයකු ලෙස ඔබ මූලික කාර්ය තුනක් කරයි.**

**1. ඔබ උපදෙස් දෙයි.**

- ඉගෙනුම් ද්‍රව්‍ය සමඟ වැඩ කරන ආකාරය හා මොඩියුලයෙන් හා ඒ ඒ ක්‍රියාකාරකමින්
- අපේක්ෂිත දෑ එක් එක් ශිෂ්‍යයා අවබෝධ කර ගන්නා බවටත් වගබලා ගන්න.
- පැන නගින පරිදි සිසු ප්‍රශ්නවලට උත්තර දෙන්න.
- ශිෂ්‍යයාට ව්‍යාකුල බවක් දැනෙන ඕනෑම තොරතුරක් පැහැදිලි කරන්න. එක් එක් අභ්‍යාසයේ ප්‍රධාන අරමුණ තේරුම් ගැනීමට ශිෂ්‍යයාට උපකාර කරන්න.
- කාර්ය සාදන ප්‍රමිති සාක්ෂාත් වීම සහතික වන පරිදි කණ්ඩායම් සාකච්ඡා පැවරුම් හා ආදර්ශන වැනි කණ්ඩායම් ක්‍රියාකාරකම් මෙහෙය වන්න.
- එක් එක් ශිෂ්‍යයාගේ ක්‍රියාකාරකම් පත්‍රිකාව / පැවරුම් පත්‍රිකාව / තක්සේරු පත්‍රිකාව සමාලෝචනය කර අවශ්‍ය නම් නිවැරදි පිළිතුරු දෙන්න.
- ශිෂ්‍යයාගේ කුසලතාවල හෝ අවබෝධයේ දුර්වලතා වේ නම් හඳුනා ගැනීම සඳහා පිළිතුරු ලබා ගත් ආකාරය ශිෂ්‍යයා සමග සාකච්ඡා කරන්න.
- කුසලතා හා අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා අමතර පැහැදිලි කිරීම් හෝ ප්‍රගුණ කිරීම කරන්න.

**සටහන**

**ගුරුවරු,**

සුසාධ්‍යකාරයකු මිස සැපයුම්කරුවෝ නොවෙති. සාම්ප්‍රදායිකව ගුරුවරුන් සැලකුණේ. ඉගෙනුම් සැපයුම්කරුවන් ලෙසය. එහෙත් ඉගෙනුම් පල පාදක ඉගෙනුමේදී ගුරුවරු ඉගෙනුම සුසාධනය කරන්නෝ වෙති. නව විෂය මාලාවට අනුව, ගුරුවරු, "ඉගෙනුම් ක්‍රියාවලියේ මාර්ගෝපදේශකයෝ වෙති; දැනුම් සම්ප්‍රේෂකයෝ නොවෙති.'' (ඉගෙනුම්ලාභී කේන්ද්‍රීය අධ්‍යාපනය) ඉගැන්වීම පිළිබඳ මේ පොදු අදහස ලොව පුරා ගෞරවාදරයට පාත්‍ර වී ඇත. ඉගැන්වීමේ යෙදෙන ගුරුවරයාට හුදු සවන් දීමේ යෙදෙනවාට වඩා ඉගෙනුම්ලාභීන්ට තමන් විසින් ම පරීක්ෂණ වල යෙදෙමින් ප්‍රතිනිර්මාණයට ඉඩ දුන් කල්හි ඉගෙනුම වඩාත් අර්ථාන්විත වන බව දැන ඇති කරුණකි.

**ඕනෑම තත්ත්වයකදි ගුරුවරයා විසින්;**

ශිෂ්‍යයාගේ අවබෝධයේ වර්තමාන මට්ටම් ප්‍රබලතා හා දුබලතා තක්සේරු කළ යුතුය; ඉගෙනුම්ලාභීන්ට එකිනෙකා සමඟ සංවාදයේ යෙදීමට හා ප්‍රස්තුත පිළිබඳ ව තර්ක කිරීමට හා වාද විවාද කිරිමට අවස්ථාව සලසන ක්‍රියාකාරකම් හා ඉගෙනුම් සිද්ධි නිර්මාණය කළ යුතුය. මෙම රාමුව තුළ ඉගැන්වීම් සලසා ඇත්තේ ඉගෙනුම්ලාභීන්ට තමන් විසින් ම නව දැනුම සොයා ගැනීමට ඉඩ සලසන ආකර්ශනීය ඉගෙනුම් ද්‍රව්‍ය හා ප්‍රබෝධක ඉගෙනුම් අවස්ථා හා ඉගෙනුම් කාර්යය පිරිනමන කටයුත්තක් ලෙස ය. ඉගෙනීමේ ක්‍රියාවලියේදී ගුරුවරයාගේ කාර්යභාරය වන්නේ ඉගෙනුම් ක්‍රියාවලිය මෙහෙය වීම හා කළමනාකරණය කිරිමයි.

**2. ඔබ පොළඹවයි :**

- නිවැරැදි පිළිතුරු වැඩිදියුණු වීම් හෝ ප්‍රගතිය සම්බන්ධයෙන් ශිෂ්‍යයාට ප්‍රශංසා කරන්න
- මොඩියුලය මගින් අත්පත් කරගත් කුසලතා විදහා දැක්වීමට ශිෂ්‍යයාට උපකාර කරන්න

**3. ඔබ කළමනාකරණයේ යෙදෙයි;**

- ඉගෙනුම කෙරෙහි දැඩි බාධා (අධික සෝෂාව) ඇති නොවන බවට වග බලා ගන්න
- අවශ්‍ය ද්‍රව්‍ය සැපයුම කල් තබා සැලසුම් කරන්න
- එක් එක් ශිෂ්‍යයාගේ ප්‍රගතිය නියාමනය කරන්න

**මේ දෑ ඔබ කෙසේ කරන්නෙහිද?**

- මේ මොඩියුලයෙන් ආවරණය වන මාතෘකා හා සිසු ක්‍රියාකාරකම් සම්බන්ධ ව උනන්දුවක් දක්වන්න.
- එක් එක් ශිෂ්‍යයාගේ ගැටළු හා අවශ්‍යතා කෙරෙහි සාවධාන වන්න. ගැටලු හෝ අදහස් සමග ඕනෑම වේලාවක ඔබ වෙත පැමිණීමට සිසුන් දිරිමත් කරන්න. නියම කරන ලද වේලාවලදී සිසු අවශ්‍යතා වෙනුවෙන් රැඳී සිටින්න.
- සිසුන් කාර්යයෙහි නිරතව සිටින විට ඔවුන් ගැන සුපරික්ෂාකාරී වන්න. සහභාගී වන ශිෂ්‍යයකු කලබලයට පත්ව සිටින බවක්, හිස් බැල්මෙන් බලා සිටින බවක්, පිළිතුරු නොලියන බවක් හෝ පිටු නොපෙරලන බවක් පෙනී ගියහොත් ඔහුට උපකාර කරන්න. මේවා ශිෂ්‍යයාට උපකාර අවශ්‍ය බව පෙන්නුම් කරන ඉඟි වේ.
- මිත්‍රශීලී සහයෝගී සබඳතාවක් ප්‍රවර්ධනය කර ගන්න. "ඔව් අදහස් කරන දේ මට වැටහෙනවා" ''හා ඒක හොඳ ප්‍රශ්නයක්'' වැනි ප්‍රකාශ කිරීමෙන් ප්‍රශ්නවලට ධනාත්මකව ප්‍රතිචාර දක්වන්න. ප්‍රශ්නවලට සවන් දී වහ 'නිවැරැදි පිළිතුර දෙනු වෙනුවට ශිෂ්‍යයාගේ ගැටලු ආමන්ත්‍රණය කිරීමට උත්සාහ ගන්න.
- ප්‍රශ්නවලට සම්පූර්ණයෙන් පිළිතුරු දීම සඳහා සෑම ශිෂ්‍යයකු සඳහා ම ප්‍රමාණවත් කාලයක් ගන්න. මෙහිදී ඔබ සහ ශිෂ්‍යා යන දෙදෙනාද තෘප්තිමත් විය යුතුය.

**නොකළ යුත්තේ කුමක් ද ?**

- ශිෂ්‍යයා සමග සාකච්ඡා කිරීමේදී ශිෂ්‍යයාට අපහසුතාවයට පත්වන ආකාරයට මුහුණෙන් ඉරියව් පළ කිරීම හෝ අදහස් දැක්වීම නොකරන්න.
- සිසුන් සොයා ගැනීමට යන තොරතුරු ඉගැන්වීමෙන් වළකින්න. හඳුන්වා දෙන පැහැදිලි කිරීම් පමණක් කරන්න. පමණට වැඩි පිළිතුරු නිසි කලට පෙර ඔබ විසින් ලබා දීමෙන් සිසුන් ව්‍යාකූලත්වයට පත් විය හැකිය. ඒවා මොඩ්‍යුවලින් ඔවුනටම කියවීමට ඉඩ හරින්න.
- පමණ ඉක්මවා කතා නොකරන්න. කතා කිරීමට සිසුන් දිරිගන්වන්න.

**කාර්ය/ ක්‍රියාකාරකම් පත්‍රිකා**

ක්‍රියාකරකම් පත්‍රිකා මෙම මොඩියුලයේ වැදගත් කොටසකි. ගුරුවරයාට ක්‍රියාකාරකම් පත්‍රිකාවේ සාරාංශකොට ඇති කුසලතා ආදර්ශනය කිරීමට හැකි විය යුතුය. ක්‍රියාකාරකම් පත්‍රිකාවල දක්වා ඇති ක්‍රියාවලී අත් කරගන්නා කුසලතාවලට මගපෙන්වන අතර කුසලතාව ප්‍රගුණ කර ගැනීමට අදාළ සිසු ප්‍රගතිය ආවේෂක්ෂණය කිරීමට ගුරුවරයාට හා ශිෂ්‍යයාට ඉඩ සලයසි.

**කාර්ය සිදු කරන අතරතුරදී,**

- සිසුන්ට කණ්ඩායම්වලට බෙදීමට උදව් කරන්න
- හැකි සෑම විටම යුගල හෝ කුඩා කණ්ඩායම් වලට බෙදීමට උත්සාහ ගන්න
- සෑම ශිෂ්‍යයාටම කුසලතා ඉගෙනීමට ප්‍රගුණ කිරීමට අවස්ථාවක් ලැබීම සහතික වන පරිදි කණ්ඩායම් සමග සමීපව කටයුතු කරන්න
- අනෙකුත් ශිෂ්‍යයන් ඒකරාශි නොවන බවට හා ඔවුන්ගෙන් බාධා නොවන බවට වග බලා ගන්න
- නිරත වන කාර්යයෙහි අතරතුර සිසුන් සමීපව නිරීක්ෂණය කරමින් ඔවුන්ගේ ශිල්පීය ක්‍රම නිවැරදි කරන්න වැඩ කරන විට ප්‍රතිපෝෂණ දෙමින් නිවැරදිව හා ඉක්මනින් ක්‍රියාකාරකමෙහි යෙදෙන ආකාරය ඉගෙනීමට සිසුන්ට උපකාර කරන්න
- සිසුන්ගේ දුෂ්කරතා කඩිනමිනුත් කාර්යක්ෂමවත් විසඳනු ලැබීම සහතික කරන්න
- හැකිතාක් හොඳින් කාර්යයේ අරමුණු සාධනය කරගන්න

මොඩියුලය වෙනුවෙන් සූදානම් වීම සඳහා ඔබ කළ යුතු දේ

- මොඩියුලය කියවා එහි අභ්‍යාස කරන්න
- මොඩියුලයේ දී ඇති පිළිතුරු පත්‍රිකා බලමින් ඔබේ පිළිතුරු පරීක්ෂා කරන්න
- මොඩියුලය සම්බන්ධව කළ යුතු වැඩ සැලසුම් කර ප්‍රධාන කරුණු සැලකිල්ලට ගන්න
- සිසුනට දුෂ්කර විය හැකි කොටස් සහ ඔවුන් විසින් අසනු ලැබිය හැකි ප්‍රශ්න ගැන සිතා බලන්න
- දුෂ්කර කොටස් සම්බන්ධව උපකාර කළ හැකි ආකාරය ඉදිරිපත් විය හැකි ප්‍රශ්න-වලට පිළිතුරු දෙන ආකාරය සැලසුම් කරන්න.

## තක්සේරුව

මෙම මොඩියුලය සැලසුම් කර ඇත්තේ ඉන් ඉගෙනුම් ඵල පාදක තක්සේරු රටාවක් ප්‍රකාශ වන ලෙසය. මින් අදහස් වන්නේ මෙම මොඩියුලයේ සම්පිණ්ඩිත හා සම්භවන තක්සේරු ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කරන බවයි.

ලිඛිත පරීක්ෂණ හා කාර්ය සාධනයේ ලැයිස්තුගත කර ඇති එක් එක් ඉගෙනුම් ඵලයේ ශිෂ්‍ය සාධනය මනිනු පිණිසය. ප්‍රහේලිකා ස්වරූපයේ තක්සේරු ද ගුරුවරයාට නිර්මාණය කළ හැකිය. මේවා කාර්ය සාධන ප්‍රමිති සපුරා ගැනීමට සිසුන් දරන ප්‍රයත්න වලදී ඔවුන්ට හමුවන දුෂ්කරතා හඳුනා ගැනීමට ගුරුවරයාට උපකාර වනු ඇත.

මොඩියුලයේ දී ඇති ලකුණු දීමේ උපදේශනාවලි ශිෂ්‍ය කාර්‍ය සාධනය ඇගයීමට භාවිතය කළ හැකිය. අවශ්‍ය කාර්ය සාධන ප්‍රමිති සපුරාලීම සඳහා ගුරුවරයාට තමන් විසින්ම ලකුණු දීමේ උපදේශනාවලි නිර්මාණය කරගත හැකිය. ඇගයීමේ දී ලකුණු දීමේ ක්‍රමවේදයේ දී පහත දැක්වෙන නිර්ණායකවලට අනුව අදාළ අංකය වට කිරීමෙන් ශිෂ්‍යයා ශ්‍රේණිගත කළ හැකි යි ප්‍රවීණත්වයක් පෙන්වීමට නම් ඒ ඒ අයිතමය සඳහා අවම වශයෙන් '3' ලැබිය යුතුය. ශිෂ්‍යයාට ප්‍රවීණත්වය පෙන්වීමට නොහැකි නම් අවශ්‍ය මට්ටම සාධනය කර ගැනීමට ගුරුවරයා මඟපෙන්විය යුතුය.

සංරචක හතරෙහි ලකුණු ඒකාබද්ධ කිරීමෙන් සම්පිණ්ඩිත කාර්ය සාධන දැක්වෙන අභිධානයක් ප්‍රදානය කෙරේ. ඒ අති විශිෂ්ට, ඉතා හොඳ, හොඳ, සාමාන්‍ය හා ප්‍රමිතියට පහලයි යනුවෙනි. එම කාර්යසාධන මට්ටම් මෙසේ නිර්වචනය කෙරේ.

ශ්‍රේණිගත කිරීමේ පරිමාණය

| උපයාගත් ලකුණු | සංඛ්‍යාත්මක ශ්‍රේණිගත කිරීම | විස්තරාත්මක ශ්‍රේණිගත කිරීම | අර්ථකථන |
|---|---|---|---|
| 17 - 20 | 85 -100 | අති විශිෂ්ට | කාර්යසාධන දර්ශක සුවිශේෂි ලෙස ඉක්මවන |
| 13 - 16 | 65 - 80 | ඉතා හොඳ | කාර්යසාධන දර්ශක සැලකිය යුතු කරමින් ඉක්මවන |
| 09 - 12 | 45 - 60 | හොඳ | කාර්යසාධන දර්ශක සාධනය කරන |
| 05 - 08 | 25 - 40 | සාමාන්‍ය | කාර්ය සාදක දර්ශක අතරින් සමහරක් පමණක් සාධනය කරන |
| 01 - 04 | 05 - 20 | ප්‍රමිතියට පහළ | කාර්ය සාධන දර්ශක සාධන නොකරන |

ගුරුවරයා ශිෂ්‍යයන්ට තමන්ගේ කාර්ය සාධන ගොනු පවත්වා ගැනීමට උපදෙස් දිය යුතුය. ශිෂ්‍යයන්ට ඔවුන්ගේ මොඩියුල වල ඇති ක්‍රියාකාරකම්/ තක්සේරු/ පැවරුම් කාර්ය පත්‍රිකා භාවිත කළ හැකියි. නොඑසේ නම් ගුරුවරයාට ඇමුණුමේදී දී ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡායාස්ථ පිටපත් ගෙන තක්සේරු පත්‍රිකාවල වෙන් වෙන් පිටපත් සපයා දිය හැකියි.

මොඩියුලයට අදාල ව ලකුණු මඟින් සම්බාර (Credit) අගය තීරණය කරනු ලැබේ. එම සම්බාර (Credit) අගය තීරණය කිරීම සඳහා සම්භවන තක්සේරුව (Formative Assessment) හා සම්පිණ්ඩිත ඇගයීම (Summative Evaluation) යොදා ගනු ඇත. එහි බර තැබීම පහත පරිදි වේ.

- සම්භවන තක්සේරුව - 70%
- සම්පිණ්ඩිත ඇගයීම - 30%

**සම්භවන තක්සේරුව (70%)**

සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ ඇතුළත් අංක 1 සිට 6 දක්වා වන ක්‍රියාකාරකම් යොදා ගන්න. එක් එක් ක්‍රියාකාරකම මගින් සාක්ෂාත් කර ගනු ඇතැයි අපේක්ෂා කරන ඉගෙනුම් පල පිළිබඳ සැලකිලිමත් වෙමින් නිර්ණායක මූලික ව ගොඩනගා ඇති රුබ්රික් (Rubric) අනුව ශිෂ්‍යයා තක්සේරු කරන්න. තක්සේරු ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේ දී අංක 06 වගුව නිදර්ශනයට ගන්න.

| අනු අංකය | ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම | නිර්ණායකය 1 | | | | නිර්ණායකය 2 | | | | නිර්ණායකය 3 | | | | නිර්ණායකය 4 | | | | නිර්ණායකය 5 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රාප්ති මට්ටම | | | | ප්‍රාප්ති මට්ටම | | | | ප්‍රාප්ති මට්ටම | | | | ප්‍රාප්ති මට්ටම | | | | ප්‍රාප්ති මට්ටම | | | | |
| | | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **4** | **3** | **2** | **1** | **20** |
| 01 | A | 4 | | | | | 3 | | | 4 | | | | 4 | | | | | 3 | | | 18 |
| 02 | B | 4 | | | | 4 | | | | 4 | | | | | 3 | | | 4 | | | | 19 |
| 03 | C | | 3 | | | | | 2 | | | 3 | | | | 3 | | | 4 | | | | 15 |

නිර්ණායක 05ක් ගොඩනගා ඇති ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 20ක් හා නිර්ණායක 04ක් ගොඩනගා ඇති ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 16ක් ද වනසේ එක් එක් තක්සේරු ක්‍රියාකාරකම සඳහා ලකුණු ගණනය කර ඇත. ඒ අනුව මොඩියුලයේ අන්තර්ගත තක්සේරු ක්‍රියාකාරකම් අංක 1, 2, 4 සහ 6 සඳහා ලකුණු 20ක් වශයෙන් ද, 3 සහ 5

තක්සේරු ක්‍රියාකාරකම් 06 සඳහා එක් එක් ශිෂ්‍යයා විසින් උපයා ගත් මුලු ලකුණු 70% වශයෙන් බර තැබීම සිදු කරන්න. ඒ සඳහා පහත සූත්‍රය භාවිත කළ හැකි ය.

$$\text{මොඩියුලය අවසානයේ ශිෂ්‍යයා විසින් ලබා ගත් සම්භවන} \quad \frac{X}{112}$$

(X යනු මොඩියුලයට අදාළව ශිෂ්‍යයා විසින් උපයාගත් ලකුණුවල එකතුව)

සම්භවන තක්සේරුව සඳහා අඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා සිසුන්ට අවස්ථා කිහිපයක දී වුවත් නැවත නැවත තක්සේරු ක්‍රියාකාරකමේ නිරතව ඉහළ ලකුණක් කරා ලඟා විය හැකිය. ඒ සඳහා සිසුන්ට අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ මඟපෙන්වීම් ලබාදීම

**සම්පිණ්ඩිත ඇගයීම (30%)**

මොඩියුලයේ සමස්ත ක්‍රියාකාරකම් පාදක කර ගනිමින් සම්පිණ්ඩිත ඇගයීම සිදු කරන්න. සුදුසු ශිල්ප ක්‍රමයක් යොදා ගනිමින් විෂය අන්තර්ගතය පරික්ෂා කිරීමට ඔබට පිළිවන. (උදා: විද්‍යුත් සමර්පණ ඉදිරිපත් කිරීම, ව්‍යුහගත රචනා ප්‍රශ්න. පැවරුම්, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ වැනි) ඒ සඳහා එක් ශිෂ්‍යයකුට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය 30% කි.

මෙම මොඩියුලයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 100ක් වේ. අංක 07 වගුවේ දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන එය ගණනය කරන්න. එක් එක් ශිෂ්‍යයා ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රතිශතයට (%) අදාළ ශ්‍රේණිය (Letter Grade) හා ඊට අයත් GPV (Grade Point Value) අගය තිරණය කර ගැනීමට ඇමුණුම් 1 උපයෝගී කර ගත යුතුය. අවසාන ලකුණ ගණනයට සහ සම්භාරය (Credit) තීරණය කිරීම සඳහා ඇමුණුම 3 ට ඇතුළත් අවසන් ලකුණු ගණනය කිරීමේ ලේඛනය භාවිත කරන්න.

අංක 07 වගුව (භාවිතයේ පහසුව සඳහා සවිස්තරාත්මක ලේඛනයක් ඇමුණුම - 3 හි දක්වා ඇත)

| අනු අංකය | ශිෂ්‍ය/ ශිෂ්‍යාවගේ නම | Formative assessment -70% | | | | | | | | Summative Evaluation 30% | මුළු ලකුණු 100% (70%+30%) | ශ්‍රේණිය (Letter Grade) | Grade Point Value (GPV) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | AC-1 | AC-2 | AC-3 | AC-4 | AC-5 | AC-6 | Total marks 112 | 70% | | | | |
| | | 20 | 20 | 16 | 20 | 16 | 20 | | | | | | |
| 01 | | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | | |

ඇමුණුම - 1

| Marks | Letter Grades | Grade Point Value | Remarks | Credits Earned |
|---|---|---|---|---|
| 80-100 | A | 4.00 | Excellent | Yes |
| 75-79 | A- | 3.67 | Extremely Good | Yes |
| 70-74 | B+ | 3.33 | Very Good | Yes |
| 65-69 | B | 3.00 | Good | Yes |
| 60-64 | B- | 2.67 | Fairly Good | Yes |
| 55-59 | C+ | 2.33 | Satisfactory | Yes |
| 50-54 | C | 2.00 | Quite Satisfactory | Yes |
| 45-49 | D | 1.67 | Poor | No |
| 40-44 | D- | 1.33 | Very Poor | No |
| 35-39 | E | 1.00 | Extremely Poor | No |
| 0-34 | F | 0.00 | Failed | No |

## මොඩියුල ක්‍රියාකාරකම් සඳහා ලකුණු ගණනය කිරීමේ ලේඛනය

විෂය :

ශ්‍රේණිය :

වාරය :

මොඩියුලය :

ඉගෙනුම් පල :

ක්‍රියාකාරකම :

| ඇතු. අංකය | ශිෂ්‍ය/ ශිෂ්‍යාවගේ නම | නිර්ණායකය 1 | | | | නිර්ණායකය 2 | | | | නිර්ණායකය 3 | | | | නිර්ණායකය 4 | | | | නිර්ණායකය 5 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 20 |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

## මොඩියුලය සඳහා අවසන් ලකුණු ගණනය කිරීමේ ලේඛනය

විෂය :

ශ්‍රේණිය :

වාරය :

මොඩියුලය :

| ඇතු අංකය | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | Formative Assessment -70% | | | | | | | | Summative Evaluation 30% | මුළු එකතුව 100% (70%+30%) | ශ්‍රේණිය (Letter Grade) | Grade Point Value(GPV) | සම්මාරය (Credit ) Yes/No |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Activity | | | | | | Total marks 112 | 70% | | | | | |
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | | | | |
| | | 20 | 20 | 16 | 20 | 16 | 20 | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

| පටුන | පිටු අංකය |
|---|---|


**01.** ශ්‍රී ලංකාවේ ආගම් හඳුනා ගෙන සහජීවනයෙන් කටයුතු කරමු 01 - 06

1.1. මගේ ආගම බුද්ධාගම යි

1.2. අපේ රටේ ආගම් හඳුනා ගනිමු; ගරු කරමු

1.3. ආගමික සහජීවනයෙන් දිවි ගෙවමු

**02.** අප මහබෝසතාණෝ 07 - 11

2.1. සතර පෙරනිමිති

2.2. මහාභිනිෂ්ක්‍රමණය

2.3. බුදුබව සොයා ගිය අප මහබෝසතාණෝ

**03.** මූලික ධර්ම ග්‍රන්ථ හඳුනා ගනිමු 12 - 14

3.1. අපේ ත්‍රිපිටකය සරල ව හඳුනා ගනිමු

3.2. දිවිමගට සරු ඔවදන්

**04.** ශ්‍රාවක චරිත උගෙන ගුණගරුක දරුවෝ වෙමු 16 - 17

4.1. අපේ රාහුල පොඩි හාමුදුරුවෝ

**05.** පන්සිල් සුරකිමු 18 - 19

5.1. ගිහි ශ්‍රාවකයාගේ නිත්‍ය සීලය හඳුනා ගනිමු

5.2. දිවි පරදුවට තබා සිල් රැකි උපාසකතුමා

**06.** තිලකුණු හඳුනා ගනිමු 20 - 21

6.1. වෙනස් වන ස්වභාවය දකිමු

6.2. තිලකුණු හඳුනා ගෙන මැදහත් සිතින් ක්‍රියා කරමු

**07.** සතර සංග්‍රහ වස්තුවෙන් සැමට සලකමු 22 - 23

7.1. දානය හා ප්‍රියවචන පුහුණු කරමු

7.2. අර්ථචර්යාව හා සමානාත්මතාවෙන් කටයුතු කරමු

**08** සම්මා සතියෙන් දිවි ගෙවමු 24 - 26

8.1. සම්මා සතිය හඳුනා ගනිමු

8.2. සතිමත් ව ක්‍රියා කරමු

| පාඩම | කාලච්ඡේද ගණන |
|---|---|
| **මොඩියුල අංක 1** | |
| 01. ශ්‍රී ලංකාවේ ආගම් හඳුනා ගෙන සහජීවනයෙන් කටයුතු කරමු | 3 |
| 02. අප මහබෝසතාණෝ | 4 |
| 03. මූලික ධර්ම ග්‍රන්ථ හඳුනා ගනිමු | 3 |
| **මොඩියුල අංක 2** | |
| 04. ශ්‍රාවක චරිත උගෙන ගුණ ගරුක දරුවෝ වෙමු | 2 |
| 05. පන්සිල් සුරකිමු | 2 |
| 06. තිලකුණු හඳුනා ගනිමු | 2 |
| 07. සතර සංග්‍රහ වස්තුවෙන් සැමට සලකමු | 2 |
| 08. සම්මා සතියෙන් දිවිගෙවමු | 2 |
| මුළු ගණන | 20 |

# ආගම් හා සාරධර්ම අධ්‍යාපනය

# බුද්ධ ධර්මය

## 6 ශ්‍රේණිය

### පළමු වාරය : මොඩියුල අංක 1

# 01. ශ්‍රී ලංකාවේ ආගම් හඳුනා ගෙන සහජීවනයෙන් කටයුතු කරමු

**ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්**

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 1. ශිෂ්‍යයා බුදුදහම හඳුනාගෙන වෙනත් ආගමිකයන් සමග සහයෝග යෙන් කටයුතු කරයි. | 1.1 ස්වකීය ආගම, ශාස්තෘන් වහන්සේ, පූජනීය ග්‍රන්ථ, බෞද්ධ සිද්ධස්ථාන, ආගමික උත්සව, පූජ්‍ය පක්ෂය සහ බුදුදහම බිහි වූ ස්ථානය නිවැරදි ව නම් කරයි. |
| | 1.2 ශ්‍රී ලංකාවේ දැකිය හැකි ආගම් ලැයිස්තුගත කරයි. |
| | 1.3 ලැයිස්තුගත කරන ලද ආගම්වල ශාස්තෘන් වහන්සේ/ආදි කර්තෘ/නිර්මාතෘ, ආගමික සංකේතය, පූජනීය ග්‍රන්ථ, ආගමික ස්ථාන, ආගමික උත්සව, පූජ්‍ය/පූජක පක්ෂය හැඳින්වෙන නාමයන් නිවැරදි ව දක්වයි. |
| | 1.4 සමාජය තුළ ආගමික සංකල්ප පැවතීමේ වැදගත්කම සාකච්ඡා කරයි. |

## 1.1 මගේ ආගම බුද්ධාගම යි

අරමුණ : බුදුදහමේ මූලික තොරතුරු හඳුනා ගැනීම
කාලය : මිනිත්තු 50 යි

- **ගුණාත්මක යෙදවුම්**
  බුදුදහම පිළිබඳ මූලික තොරතුරු ඇතුළත් පින්තූර කිහිපයක්

- **ක්‍රමය හා ක්‍රමවේදය**
  ප්‍රශ්නෝත්තර ක්‍රමය, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය

- **උපදෙස්:**
  - බුදුදහමට අදාළ මූලික තොරතුරුවල (සංකේතය, සිද්ධස්ථානය, ග්‍රන්ථය....) අදාළ පින්තූර කිහිපයක් හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

- එහි දැක්වෙන සංකල්ප විමසමින් දරුවන්ගේ පෙර දැනුම විමර්ශනය කරන්න.
- පෙළ පොත පදනම් කර ගනිමින් ශිෂ්‍යයාගේ පෙර දැනුම විමසා බැලෙන එම ක්‍රියාකාරකම් දක්වා ඇති ප්‍රකාශයන් දන්නේ නම් හරි (✓) ලකුණ ද, නො දන්නේ නම් කතිර ලකුණ ද (**X**) A තීරුවෙහි ලකුණු කිරීමට සිසුන්ට දැනුවත් කරන්න.
- එම ක්‍රියාකාරකමෙන් පසු එක් එක් ප්‍රකාශයන් සඳහා "දනිමි" ලෙස හා ''නො දනිමි" ලෙස සඳහන් කර ඇති සිසුන් තමන් කැමැති ක්‍රමවේදයක් ඔස්සේ හඳුනා ගන්න.
- අනතුරුව පාඩමෙහි දැක්වෙන බුදු දහමේ මූලික තොරතුරු පිළිබඳ අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- සාකච්ජාවෙන් පසු ක්‍රියාකාරකම් 1හි A B තීරුව සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන්න.
- පාඩම පිළිබඳ ව සිසුන් සමඟ සමාලෝචනයක නිරත වෙන්න.
- අනතුරුව එම දැනුම භාවිත කරමින් ''ක්‍රියාකාරකම් 2'' තනි තනිව සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සම්පූර්ණ කළ පසු එම තොරතුරු ළඟ යහළුවා සමග සාකච්ඡා කොට නිවැරදි කර ගැනීමට කාලය ලබා දෙන්න.
- අනතුරුව සිසුන් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාකාරකම් 2හි පිළිතුරු එකින් එක පන්තියට ඉදිරිපත් කරමින් ඒ පිළිබඳ ව සාකච්ඡාවක නිරත වෙන්න.
- කෙටි පිළිතුරු සඳහා අවශ්‍ය ලකුණු විනිවිද භාවයෙන් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම1 හි B තීරුව අවසානයට සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන්න.

**ක්‍රියාකාරකම් 2 සඳහා පිළිතුරු**

- බුද්ධාගම, 1. බුදුරජාණන් වහන්සේ 2. ධර්මචක්‍රය 3. ස්වාමීන් වහන්සේ/භික්ෂුන් වහන්සේ/භික්ෂුණීන් වහන්සේ, මෙහෙණින් වහන්සේ 4. වෙසක්, පොසොන්, ඇසළ, .... 5. පන්සල 6. ඉන්දියාව (භාරතය), 7. බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය, 8. ත්‍රිපිටකය
- වැඩිදුර ඉගෙනුම් කොටසෙහි අත්පත්‍රිකාව නිර්මාණශීලී ව සැකසීමට ශිෂ්‍යයන් දිරි ගන්වන්න.
- වැඩිදුර ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා සිසුන් දැනුවත් කරන්න.
    - අත්පත්‍රිකාවක ගුණාංග
    - ආකෘතිය
    - නිර්මාණශීලිත්වය

යන කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

# 1.2 අපේ රටේ ආගම් හඳුනා ගනිමු; ගරු කරමු

අරමුණ : ශ්‍රී ලංකාවේ ආගම්වල මූලික ලක්ෂණ හඳුනා ගැනීම
කාලය : මිනිත්තු 50 යි

- **ගුණාත්මක යෙදවුම්**
  - ආගමික සංකේත හා ස්ථාන දැක්වෙන පින්තූර කිහිපයක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
  - සුදුසු පරිදි තාක්ෂණික මෙවලම් ද භාවිත කරන්න. (Presentation, Maltimedia)

- **ක්‍රමය හා ක්‍රමවේදය**

  ප්‍රශ්නෝත්තර ක්‍රමය, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය

**උපදෙස්:**

- ආගමික සංකේත හා ස්ථාන දැක්වෙන අදාළ පින්තූර කිහිපයක් ප්‍රදර්ශනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- එහි දැක්වෙන ආගමික සංකේත හා ස්ථාන පිළිබඳ විමසමින් දරුවන්ගේ පෙර දැනුම විමර්ශනය කරන්න.

1.2 **පාඩමෙහි විෂය හැඳින්වීමෙහි දැක්වෙන ආගම් හා එහි මූලික ලක්ෂණ පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක නිරත වෙන්න.**

- ක්‍රියාකාරකම 01 සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් 01 තනි තනිව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සම්පූර්ණ කළ පසු පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව සිසුන් ඉදිරිපත් කළ පිළිතුරු එකින් එක ගෙන සමාලෝචනයක නිරත වෙන්න.
- සිසුන් ඉදිරිපත් කළ කරුණුවලට ඌනපූරණ හා සංවර්ධනාත්මක අදහස් දක්වමින් ප්‍රතිපෝෂණය සපයන්න.

**ක්‍රියාකාරකම 02 සඳහා උපදෙස්**

**තක්සේරුව හා ඇගයීම 02**

- මෙම ක්‍රියාකාරකම මොඩියුලයේ පාඩමට අනුව උපදෙස් ලබා දී පාසල් පාදක ඇගයීමක් සඳහා යොදා ගන්න.
- ඒ සඳහා සුදුසු කාලයක් හා පරිසරයක් සකසා ගන්න.

- ක්‍රියාකාරකම 02 සඳහන් පරිදි සිසුන් කණ්ඩායම් කර කියවීම් පොතෙහි දැක්වෙන පරිදි එහි ආකෘතිය පදනම් කර ගෙන ප්‍රදර්ශනාත්මක නිර්මාණ පුවරුවක් නිර්මාණය කිරීම සඳහා සිසුන් යොමු කරන්න.
- එහි සඳහන් සිරස් හා තිරස් උප තේමා පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- රුබ්රික් වගුවෙහි දැක්වෙන ලකුණු දීමේ නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- නිර්මාණ ඉදිරිපත් කිරීමෙන් පසු රුබ්රික් වගුවට අනුව ලකුණු ප්‍රදානය කරන්න.
  පිළිතුරුඃ ක්‍රියාකාරකමට අනුව නිර්මාණශීලි විය යුතුයි.

| **ආගමේ නම** | **බෞද්ධ** | **සෛවනෙරි** | **ඉස්ලාම්** | **කතෝලික** | **ක්‍රිස්තියානි** |
|---|---|---|---|---|---|
| **1. ආගමික සංකේත** | ධර්ම චක්‍රය | නන්දි ගවයා | හඳ, තරුව | ශ්‍රී කුරුසය | කුරුසය |
| **2. ශාස්තෘන් වහන්සේ හෝ දෙවියන් වහන්සේගේ නම** | බුදුරජාණන් වහන්සේ | සිවපෙරුමාන් | අල්ලාහ් දෙවියන් | දෙවියන් වහන්සේ | ජේසුස් වහන්සේ |
| **3. ආගමික පූජනීය ග්‍රන්ථ** | ත්‍රිපිටකය | වේද ග්‍රන්ථ | අල් කුරාණය | කතෝලික ශුද්ධ බයිබලය | ක්‍රිස්තියානි ශුද්ධ බයිබලය |
| **4. ආගමික ස්ථානය** | පන්සල | කෝවිල | මස්ජිදය | කතෝලික පල්ලිය | ක්‍රිස්තියානි පල්ලිය |
| **5. ප්‍රධාන ආගමික උත්සව** | වෙසක්<br>පොසොන්<br>ඇසළ | තෛපොංගල්,<br>මහා ශිවරාත්‍රී,<br>නවරාත්‍රී | රාමසාන්<br>හජ්ජි | නත්තල<br>පාසකුව<br>ශුද්ධවන්ත මංගල්ල | නත්තල<br>පාස්කුව |
| **6. ආගමික පූජක පක්ෂය හඳුන්වන නම** | භික්ෂූන් වහන්සේ/<br>භික්ෂුණීන් වහන්සේ<br>ස්වාමීන් වහන්සේ<br>මෙහෙණින් වහන්සේ | සිවාචාරියාර් | මවුලවි | පූජාප්‍රසාදීන් වහන්සේ | පූජකතුමා<br>පූජකතුමිය |

කාර්යසාධන මට්ටම් වගුව

| නිර්ණායක | කාර්යසාධන මට්ටම් | | |
|---|---|---|---|
| | විශිෂ්ටයි (ලකුණු 10-08) | මධ්‍යස්ථයි (ලකුණු 7-4) | සංවර්ධනය විය යුතුයි (ලකුණු 3-1) |
| විෂය අන්තර්ගතය | සියලු ම මාතෘකාලට අදාළ නිවැරදි තොරතුරු ඇතුළත් කර ඇත. අදාළ බවින් යුතු ව ඉදිරිපත් කර ඇත. | බොහෝ මාතෘකාවලට අදාළ ව තොරතුරු නිවැරදි ය. සමහර කරුණු අදාළ බවින් යුතුය. | මාතෘකාවලට අදාළ වන අතර තොරතුරු කිහිපයක් පමණක් ඉදිරිපත් කර ඇත. |
| නිර්මාණශීලී බව | වර්ණ, ආකෘති, රූප හෝ උචිත ද්‍රව්‍ය භාවිත කරමින් ඉතා උසස් ආකාරයෙන් නිර්මාණශීලීව ඉදිරිපත් කර ඇත. | වර්ණ, ආකෘති, රූප හෝ උචිත ද්‍රව්‍ය භාවිත කරමින් නිර්මාණශීලී උත්සාහයක් දරා ඇත. | වර්ණ, ආකෘති, රූප හෝ උචිත ද්‍රව්‍ය භාවිත කර ඇත. |

# 1.3 ආගමික සහජීවනයෙන් දිවි ගෙවමු

අරමුණ : සියලු ආගමිකයන් සහජීවනයෙන් කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීම

**ගුණාත්මක යෙදුම්**

- ලිවීමට අදාළ කොළ, පෑන් හෝ වෙනත් ආධාරක

**ක්‍රමය හා ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය,

**උපදෙස්:**

- සියලු ජන කොට්ඨාස සමඟ එකට කටයුතු කරන අවස්ථා කිහිපයක් ප්‍රදර්ශනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- ආගමික සහජීවනයෙන් කටයුතු කිරීමේ දී ගැටලු නිරීක්ෂණය, සහයෝගීතාව, සාදාචාරාත්මක පැවැත්ම, අන්‍යයන්ට ගරු කිරීම වැදගත් වන බව පෙන්වා දෙමින් සාකච්ඡාව මෙහෙය වන්න.

- පාඩම සංවර්ධනය කිරීමට මග පෙන්වන්න.
- සමාලෝචනය සිදු කරන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- පෙළ පොත පදනම් කර ගනිමින් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- සිසුන් ප්‍රමාණය අනුව සුදුසු පරිදි කණ්ඩායම් ගත කර මාතෘකා ලබා දෙන්න..
- මොඩියුලයෙහි සඳහන් පහත මාතෘකා ලබා දී ඒ පිළිබඳ තොරතුරු අධ්‍යයනයට අවස්ථාව ලබා දෙන්න. (එක් කණ්ඩායමකට එක් මාතෘකාවක් ලබා දිය හැකිය.)

  **මාතෘකා** - ගැටුම් නිරාකරණය/සහයෝගිතාව/සදාචාරාත්මක පැවැත්ම/අන්‍යයන්ට ගරු කිරීම)
- ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- සාකච්ඡාවේ නිවැරදි තොරතුරු සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සාකච්ඡා කළ කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ඉදිරිපත් කළ කරුණුවලට ඌනපූරණ හා සංවර්ධනාත්මක අදහස් දක්වමින් ප්‍රතිපෝෂණය සපයන්න.

# 02. අප මහබෝසතාණෝ

## ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 2. ශිෂ්‍යයා සිදුහත් කුමර අවධිය හා සිදුහත් තාපස අවධියේ සුවිශේෂ අවස්ථා පිළිබඳ විමර්ශනය කරයි. | 2.1 සිද්ධාර්ථ කුමාරයාණන් අත්දුටු සතර පෙර නිමිති විග්‍රහ කරයි. |
| | 2.2 බෝසතාණන් වහන්සේගේ මහා අභිනිෂ්ක්‍රමණය ආශ්‍රිත සුවිශේෂ සිදුවීම් පැහැදිලි කරයි. |
| | 2.3 බෝසතාණන් වහන්සේගේ කුසල ගවේෂී අවධිය විස්තර කරයි. |

## 2.1 සතර පෙරනිමිති

අරමුණ : සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිතිවල වැදගත්කම පැහැදිලි කරමින් ජීවිතයේ යථාර්ථය පැහැදිලි කිරීම

කාලය : මිනිත්තු 50 යි

**ගුණාත්මක යෙදුම්**

සතර පෙර නිමිති දැක්වෙන පොස්ටර්, ඡායාරූප, වීඩියෝ හෝ ඕනෑම දෘශ්‍ය මාධ්‍යයක් උපයෝග කරගෙන ප්‍රදර්ශනයට උචිත පින්තූර සටහන් සූදානම් කර ගන්න.

**ක්‍රමය හා ක්‍රමවේදය**

ප්‍රශ්නෝත්තර ක්‍රමය, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය

**උපදෙස්:**

- සතර පෙරනිමිති සම්බන්ධ ඡායාරූප, පෝස්ටර්, වීඩියෝ ආදිය ප්‍රදර්ශනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- පෙළ පොත පදනම් කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- සතර පෙරනිමිති දැකීම පිළිබඳ සිසුන්ට සාකච්ඡා කරන්නට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ සිසුන් අතර සංවාදයක් ගොනු කරන්න.

- සිසුන්ගේ ප්‍රතිචාර දක්වීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක් සිදු කරන්න.
    - **බෝසතාණන් වහන්සේගේ අධිෂ්ඨානය**
    - **ගවේෂණශීලිත්වය**

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්ගත කරන්න.
- සතර පෙරනිමිති සුදුසු පරිදි කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එම පෙර නිමිතිවලින් බෝසථාණන් තුළ වූ අධිෂ්ඨානශීලි බව, ගවේෂණශී බව සමතු වන ආකාරය විමර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- සුදුසු පරිදි ඌනපූරණය ලබා දෙන්න.

## 2.2 මහාභිනිෂ්ක්‍රමණය

අරමුණ : බෝසතුන්ගේ මහාභිනිෂ්ක්‍රමණය සියලු ලෝ සතුන්ගේ යහපත උදෙසා සිදු වූවක් බව පැහැදිලි කර දීම.

කාලය : මිනිත්තු 50 යි

**උපදෙස්**

- මෙම පාඩමෙහි විෂය අන්තර්ගතයට අනුව මහාභිනිෂ්ක්‍රමණය පිළිබඳ තොරතුරු ගවේෂණය සඳහා සිසුන්ට කාලය ලබා දෙන්න.
- අනතුරුව සිද්ධාර්ථ කුමාරයාණන්ගේ
    - විමර්ශනශීලී බව
    - අධිෂ්ඨාන ශක්තිය
    - සත්‍ය ගවේෂණය ආදි ගුණාංග ඉස්මතු වන අයුරින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- ඉහත සාකච්ඡාවට අනුව කරුණු ගොනු කිරීම සඳහා කණ්ඩායම් යොමු කරන්න.
- මහාභිනිෂ්ක්‍රමණයේ දී සිදුහත් තාපසතුමාට මුහුණ දීමට සිදුවූ අභියෝග හා මහාභිනිෂ්ක්‍රමණයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ ලිවීමට යොමු කරන්න
- ක්‍රියාකාරම අවසන් වීමෙන් පසු අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුට ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- එම ක්‍රියාකාරකම පිළිබඳ සංවර්ධනාත්මක අදහස් අභිප්‍රේරණය කරමින් සිසුන් අගයන්න.
- පිළිතුරු දුෂ්කරතා ඇති සිසුන්ට මඟ පෙන්වන්න.

# 2.3 බුදුබව සොයා ගිය අප මහබෝසතාණෝ

අරමුණ : බුදුබව අවබෝධ කර ගනු පිණිස සත්‍යය සෙවීමේ මාර්ගයට බෝසතාණන් වහන්සේ යොමු වූ ආකාරය අධ්‍යයනය කිරීම

කාලය : මිනිත්තු 50 යි

**ක්‍රමය හා ක්‍රමවේදය**

ප්‍රශ්නෝත්තර ක්‍රමය, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය

**උපදෙස්:**

- මෙම පාඩම අධ්‍යයනයේ දී සිද්ධාර්ථ තාපසයාණන් තුළ තිබූ පහත ලක්ෂණ ඉස්මතු වන ලෙස සාකච්ඡා කරන්න.
    - ලෝවැසියාගේ යහපත සඳහා සියලු සැප අත්හැරි බව
    - ගුරුවරයාට කීකරු බව
    - ඉගෙන ගැනීමේ ඇති උනන්දුව හා ඥාන ගවේෂණයට කැප වූ බව
    - ගුරුවරුන් සිද්ධාර්ථ තාපසතුමා ගැන පැහැදී ගුරු තනතුරු පවා ප්‍රදානය කළ බව
    - අධිෂ්ඨානශීලි බව (ගුරුවරුන් ළඟ සිට ඥාන තත්ත්වයන්වලට පැමිණීම)
    - අරමුණු පැහැදිලි බව හා අරමුණු ළඟා කර ගත් බව
    - අනතිමානී බව
- පාඩම සංවර්ධනාත්මක අදහස් ප්‍රකාශ කරමින් සමාලෝචනය කරන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- පෙළ පොත පදනම් කර ගනිමින් ක්‍රියාකාරකමෙහි නිරත කර වන්න.
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් පන්තියේ සිසුන් කණ්ඩායම් ගත කරන්න.
- මොඩියුලයේ සඳහන් මාතෘකාවලට අනුව කණ්ඩායම්වලට නියමිත මාතෘකා ලබා ගත් පසු එම තේමාවට අදාළ තොරතුරු අධ්‍යයනයට උපදෙස් දෙන්න.
- සෑම කණ්ඩායමක් විසින් ම

- ▪ මහා අභිනිෂ්ක්‍රමණයේ අරුත
- ▪ මහා අභිනිෂ්ක්‍රමණයෙ වටිනාකම
- ▪ අපේ ශිෂ්‍ය ජීවිතයට එයින් ගත හැකි ආදර්ශ යන කරුණු පිළිබඳව සාකච්ඡා කර සටහනක් ගොඩනැගීමට උපදෙස් ලබාදෙන්න.

- ගවේෂණය කළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**තක්සේරුව හා ඇගයීම 02.**

- 2.1, 2.2 හා 2.3 යන පාඩම් හා ක්‍රියාකාරකම් සැලකිල්ලට ගනිමින් පහත සඳහන් තක්සේරුව සිදු කරන්න.
- මෙය පාසල් පාදක ඇගයීමක් ලෙස සලකා කටයුතු කරන්න.
- ▪ සතර පෙරනිමිති දැකීමේ සිට බුද්ධත්වයට පත්වීමට පෙර බෝසතාණන් වහන්සේගේ තොරතුරු ඇතුළත් කොට තව කෙනෙකුට කියවීම සඳහා පොත් පිංචක් ලෙස සැකසීමට මග පෙන්වන්න.
- ▪ සිසුන් කණ්ඩායම් ගත කොට ක්‍රියාකාරකම් සඳහා පොදු උපදෙස් ලබා දෙන්න.
- නිර්මාණාත්මක අත් පොත් පිංච සැකසීම පිළිබඳ පහත සඳහන් අදහස් සැලකිල්ලට ගෙන මාර්ගෝපදේශ සපයන්න.

අන්තර්ගතය

සතර පෙර නිමිති. අධිෂ්ඨානය හා වීර්යය, මහාභිනිෂ්ක්‍රමනය ආරම්භ කිරීමට හේතු හා ඒ අතරතුර සිදුවීම්, බුදුබව සොයා යෑම (ගුරුවරුන් හමුවීම හා දුෂ්කර ක්‍රියා)

නිර්මාණශීලී සැලැස්ම

උචිත රූප, සංකේත හෝ කතා රටා භාවිතය, ආකෘති හා නිර්මාණශීලීත්වය

''බුද්ධත්වයට පත්වීමට පෙර බෝසතාණන් වහන්සේගේ ගමන් මඟ'' තව කෙනෙකුට කියවීම සඳහා සකසන ලද පොතක් ආකාරයට කරුණු ගොනු කරන්න.

- ▪ මෙම ක්‍රියාකාරකම අවසානයේ කළ කාර්ය ඇගයීම සඳහා පහත රූබ්රික් (Rubric) වගුව භාවිත කර ලකුණු ලබා දෙන්න.

කාර්යසාධන මට්ටම් වගුව

| නිර්ණායක | කාර්යසාධන මට්ටම් | | |
|---|---|---|---|
| | විශිෂ්ටයි (ලකුණු 10-08) | මධ්‍යස්ථයි (ලකුණු 7-4) | සංවර්ධනය විය යුතුයි. (ලකුණු 3-1) |
| විෂය අන්තර්ගතය | සියලු ම මාතෘකාවලට අදාළ නිවැරදි විෂය කරුණු ඇතුළත් කර ඇත. අදාළ බවින් යුතුව ඉදිරිපත් කර ඇත. | බොහෝ මාතෘකාවලට අදාළ ව විෂය කරුණු නිවැරදි ය. සමහර කරුණු අදාළ බවින් යුතු ය. | මාතෘකාවලට අදාළ වන අතර විෂය කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කර ඇත. |
| නිර්මාණශීලී බව | වර්ණ, ආකෘති, රූප හෝ උචිත සංකල්ප, ද්‍රව්‍ය භාවිත කරමින් ඉතා උසස් ආකාරයෙන් නිර්මාණශීලී ව ඉදිරිපත් කර ඇත. | වර්ණ, ආකෘති, රූප හෝ උචිත සංකල්ප, ද්‍රව්‍ය භාවිත කරමින් නිර්මාණශීලී උත්සාහයක් දරා ඇත. | වර්ණ, ආකෘති, රූප හෝ උචිත සංකල්ප, ද්‍රව්‍ය භාවිත කර ඇත. |
| කණ්ඩායම් සහයෝගීතාව හා ඉදිරිපත් කිරීම් | සියලු ම දෙනාගේ පූර්ණ කැපවීමෙන් සෑම කෙනෙක් ම එක් එක් ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත. අතිවිශිෂ්ට අයුරින් පෙළ ගැසීමක් කර ඇත. | බහුතරයක් අය සහයෝගයෙන් කටයුතු කරයි. බොහෝමයක් ම අය ඉදිරිපත් කිරීමට සහයෝගය දක්වයි. මනා පෙළගැසීමක් කර ඇත. | සමහර අය සහභාගි වූහ. සමහර අය ඉදිරිපත් කිරීම් කර ඇත. |

# 03. මූලික ධර්ම ග්‍රන්ථ හඳුනා ගනිමු

**ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්**

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 3. ශිෂ්‍යයා බුදුදහමේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය හා එහි වර්ගීකරණයන් පැහැදිලි කර ගනියි. | 3.1. බුදුදහමේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය හා වර්ගීකරණයන් හඳුනා ගනියි. |
| | 3.2. හඳුනාගත් ආගමික ග්‍රන්ථයේ විශේෂ පාඨ සහ වාග්මාලාව පුහුණු කරයි. |

## 3.1 අපේ ත්‍රිපිටකය සරල ව හඳුනා ගනිමු

අරමුණ : බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්මය ඇතුළත් ත්‍රිපිටකය සහ එහි වර්ගීකරණය පැහැදිලි කර ගැනීම

කාලය : මිනිත්තු 50 යි

**ක්‍රමය හා ක්‍රමවේදය**

ප්‍රශ්නෝත්තර ක්‍රමය, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්:**

- මොඩියුලය කියවා ශිෂ්‍යයා අධ්‍යයනය කළ කරුණු පදනම් කරගෙන කෙටි ප්‍රශ්න තුනක් හා ඊට අදාළ පිළිතුරු තුනක් කුඩා පත්‍රිකාවක ලිවීමට උපදෙස් ලබා දෙන්න.
- එක් එක් ශිෂ්‍යයා ලියන ලද කුඩා පත්‍රිකා ගෙන එක් බහාලුමකට ගොනු කරන්න.
- සමස්ත සිසුන් කණ්ඩායම් පහකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම අහඹු ලෙස ගත් පත්‍රිකා පහ බැගින් බෙදා දෙන්න.
- එම කණ්ඩායම තුළ ලබා දී ඇති ප්‍රශ්න පත්‍රිකා පිළිබඳ සාකච්ඡා කර එහි අන්තර්ගත ප්‍රශ්න සියල්ල ගොනු කර එක් පත්‍රිකාවක් සැකසීමට උපදෙස් ලබා දෙන්න.
- කණ්ඩායම් පහ තුළ ගොනු කළ ප්‍රශ්න පත්‍ර පහ එකතු කර එක හා සමාන

ප්‍රශ්න හා විවිධ වර්ගයේ ප්‍රශ්න හඳුනා ගැනීමට කණ්ඩායම් අතර සාකච්ඡාවක් මෙහෙය වන්න.

- එම සාකච්ජාව ඇසුරින් සමස්ත කණ්ඩායම්වල හඳුනාගත් විවිධ ප්‍රශ්න එකතු කර අවසාන ප්‍රශ්න පත්‍රයක් සැකසීමට උපදෙස් ලබා දෙන්න.
- ගොනු කරන ලද අවසාන ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සියලු ම සිසුන්ට ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමේ කාර්යයන් තක්සේරු කර ශිෂ්‍යයන්ගේ සාධන මට්ටමට ගැළපෙන ලකුණු ප්‍රදානය කරන්න.

## 3.2 දිවිමගට සරු ඔවදන්

අරමුණ : ධම්මපද ගාථාවලින් ඉදිරිපත් කෙරෙන ආදර්ශ උගෙන චරිතවත් ජීවිතයක් ගත කිරීම

කාලය : මිනිත්තු 50 යි

**ගුණාත්මක යෙදුම්**

ධම්මපදය, ධම්මපද ග්‍රන්ථය පිළිබඳ විස්තර පත්‍රිකා

**ක්‍රමය හා ක්‍රමවේදය**

ආදර්ශන, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය

**උපදෙස්:**

- ධම්මපද ග්‍රන්ථය පන්තියට රැගෙන ඒමට උපදෙස් දී එම ධම්මපද ග්‍රන්ථය හඳුන්වා දෙමින් පාඩමට ප්‍රවේශ වෙන්න.
- ධම්මපද ගාථා දෙක නිවැරදි ව උච්චාරණයෙන් යුත්කව සජ්ඣායනා කරමින් සිසුන්ට ආදර්ශනය මගින් පෙන්වන්න.
- අනතුරුව සිසුන් ලවා ගාථා සජ්ඣායන කරවා අඩුපාඩු පෙන්වා දෙන්න.
- ගාථා දෙකෙහි තේරුම හා වග්ග පොතෙහි සටහන් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක නිරත වෙන්න.
    - ධම්මපදය ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් බව හා එහි සඳහන් ගාථා හා වග්ග පිළිබඳ සරල අවබෝධය
    - ධම්මපද ගාථා නිවැරදිව සජ්ඣායනා කරවීම
    - ධම්මපද උපදේශයන්ට අනුව ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගන්නා ආකාරය
    - නිදාන කතාව ආශ්‍රිත කතා වස්තුවේ වැදගත්කම හා ආදර්ශ

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්:**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් ගත කරන්න.
- ධම්මපද නිදාන කතාවක් හා ඊට අදාළ ගාථා ඒ ඒ කණ්ඩායම්වලට ලබා දෙන්න.
- නිදාන කථාව හා ගාථා අර්ථය කියවා ඒ තුළ වූ පුද්ගල අයහපත් හැසිරීම්, ඒ තුළින් තමාට සමාජයට වන බලපෑම හා ඉන් ඉවත් ව ඇති කර ගත යුතු ගුණ දහම් සොයා සාකච්ඡා කරන ලෙස කණ්ඩායම්වලට උපදෙස් ලබා දෙන්න.
- නියමිත වේලාව ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම ඉදිරිපත් කිරීම්වලට අදාළ ව ඌනපූරණ සපයන්න.
- විෂය අන්තර්ගත කරුණු හා වැදගත් කරුණු පොතෙහි සටහන් කිරීමට උපදෙස් දෙන්න.

# ආගම් හා සාරධර්ම අධ්‍යාපනය

# බුද්ධ ධර්මය

## 6 ශ්‍රේණිය

### පළමු වාරය : මොඩියුල අංක 2

# 04. ශ්‍රාවක චරිත උගෙන ගුණගරුක දරුවෝ වෙමු

**ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්**

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 4. ශිෂ්‍යයා ආගමික ග්‍රන්ථයන්හි නිරූපිත විශේෂ චරිත හා චරිත ලක්ෂණ හඳුනාගෙන, චරිත සංවර්ධනය උදෙසා ඒවායේ දායකත්වය අධ්‍යයනය කරයි. | 4.1 නිර්දිෂ්ට ආගමික ග්‍රන්ථ උපයෝගී කර ගනිමින් සිසුන් සිය චරිත සංවර්ධනය කර ගන්නා ආකාරය සාරාංශ කරයි. |
| | 4.2 ආදර්ශවත් චරිත ඇසුරු කර ගනිමින් තම චරිතය සංවර්ධනය කර ගත් ආකාරය පැහැදිලි කරයි. |

## 4.1 අපේ රාහුල පොඩි හාමුදුරුවෝ

අරමුණ : රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයේ මානුෂීය ගුණාංග ශිෂ්‍ය ජීවිතය තුළින් පුරුදු පුහුණු කිරීම

කාලය : මිනිත්තු 50 යි.

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය,

**උපදෙස්:**

- පාඩම ශිෂ්‍යයින්ට සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් මොඩියුලයේ පාඩම අධ්‍යයනයට යොමු කරන්න.
- රාහුල හිමියන්ගේ චරිතය හා සුවිශේෂ ගුණාංග අතර අවවාද පිළිගැනීමේ ගුණාංගය පිළිබඳව ශිෂ්‍යයෝ සමඟ සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම් සඳහා උපදෙස්:

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්ගත කරන්න.
- රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයේ ඉස්මතු වන ගුණාංග එම කණ්ඩායම්-වලට ලබා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු ගුණාංගය රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙ-න් ඉස්මතු වන ආකාරය, එය ශිෂ්‍ය ජීවිතය තුළ සංවර්ධනය කටයුතු ආකාරය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට උපදෙස් ලබා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුනු ගුණාංගයේ අවස්ථාවක් නිරූපණය වන සේ චිත්‍රයක් ඇඳීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එහි සඳහන් කථා වස්තුව අහඹු ලෙස තෝරා ගත් දරුවකු හෝ කිහිප දෙනෙකුට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉවසීමේ ගුණය ප්‍රගුණ කිරීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලබාගත හැකි ප්‍රයෝජන ලිවීමට යොමු කරන්න.
- රාහුල පොඩි හාමුදරුවන්ගේ පහත සඳහන් ගුණාංග ස්මතු කරමින් පාඩම සංවර්ධනය කරන්න.

  **(කීකරු බව, උපදෙස් පිළිගැනීම, ඉගෙනීමට උනන්දුව, ඉවසීම,ප්‍රතිපත්ති ගරුක බව, අධිෂ්ඨානය සහ වීර්යය)**

# 05. පන්සිල් සුරකිමු

**ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්**

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 5. ශිෂ්‍යයා ගිහියාගේ නිත්‍ය සීලය හඳුනා ගෙන ආරක්ෂා කරමින් අවබෝධයෙන් කටයුතු කරයි. | 5.1. පංචසීලයෙහි අර්ථාන්විත භාවය හඳුනාගෙන දෛනික ජීවිතය ගත කරයි. |
| | 5.2. පන්සිල් රැකීමේ ආනිසංස දැනගෙන නිවැරදි චර්යාවන්හි නිරත වෙයි. |

## 5.1 ගිහි ශ්‍රාවකයාගේ නිත්‍ය සීලය හඳුනා ගනිමු

අරමුණ : ගිහියකු විසින් පිළිපැදිය යුතු පංචසීල ප්‍රතිපදාව පුහුණු කිරීම

කාලය : මිනිත්තු 50 යි

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය ප්‍රශ්නෝත්තර ක්‍රමය,

**උපදෙස්:**

- පාඩම හොඳින් අධ්‍යයනයට කිරීමට සිසුන් ව යොමු කරන්න.
- එක් එක් සිල්පදයේ වටිනාකම් පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ශික්ෂා පද සිසුන් සමඟ සජ්ඣායනා කරන්න.
- පන්සිල් හා ඒවායේ සරල අර්ථය මතකයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- අනතුරුව පංචසීලය පිළිබඳ සමාලෝචනයක් සිදු කරන්න.
- එම සිල්පද ආරක්ෂා කිරීමටත් ජීවිතයට යොදා ගැනීමටත් උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්:**

- කණ්ඩායම් පහකට සිසුන් වෙන් කරන්න
- ඒ ඒ කණ්ඩායමට එක් සිල් පදය බැගින් ලබා දෙන්න
- තම කණ්ඩායමට ලැබුණු ශික්ෂා පදය කඩ කිරීමෙන් ඇති වන සමාජීය ගැටලු හා ශික්ෂා පදය ආරක්ෂා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල දැක්වෙන පරිදි භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන්න.
- එම ක්‍රියාකාරකම සිදු කිරීමට අවශ්‍ය කාලය ලබා දෙන්න.
- එම භූමිකාරංගන තුළින් මතු කරන කරුණු පිළිබඳ සමාලෝචනය කරන්න.

## 5.2 දිවි පරදුවට තබා සිල් රැකි උපාසකතුමා

| | |
|---|---|
| අරමුණ | : සිල් රැකීමේ ආනිසංස දැන කටයුතු කිරීම |
| කාලය | : මිනිත්තු 50 යි |

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය ප්‍රශ්නෝත්තර ක්‍රමය,

**උපදෙස්:**

- පාඩම හොඳින් අධ්‍යයනයට කිරීමට සිසුන් ව යොමු කරන්න.
- කථාවස්තුව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- එම සාකච්ඡාවේ දී පන්සිල් රැකීමේ ප්‍රතිඵල පිළිබඳ ව පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක් සිදු කරන්න.
    - තම ජීවිතය ආරක්ෂා වීමට හේතු වන බව
    - ප්‍රතිපත්ති ගරුකව ජීවත් විය හැකි බව

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්:**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් හෝ තනි තනි ව හෝ සාකච්ඡාව සැලසුම් කරන්න.
- පන්සිල් කඩ කිරීමෙන් සමාජයට ඇති වන ගැටලු 5ක් ලියන්න.
- පන්සිල් සුරැකීමෙන් ජීවිතයට ලැබෙන යහපත් ප්‍රතිඵල කිහිපයක් ලියන්න
- සංවර්ධනාත්මක අදහස් දක්වමින් සමාලෝචනයක යෙදෙන්න.

# 06. තිලකුණු හඳුනා ගනිමු

## ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 6. ශිෂ්‍යයා තම චරිත සංවර්ධනයට අදාළ බුදුදහමේ මූලික ඉගැන්වීම් පිළිබඳ දැනුම ලබා ගනියි. | 6.1 තම ආගමට අනුව ජීවී, අජීවී වස්තූන්ගේ වෙනස්වීම සරල ව අර්ථකථනය කරයි. |
| | 6.2 බුදුදහමේ මූලික ඉගැන්වීමක් වන ත්‍රිලක්ෂණය සරල ව පැහැදිලි කරයි. |

## 6.1 වෙනස් වන ස්වභාවය දකිමු

අරමුණ : ජීවී, අජීවී වස්තූන්ගේ වෙනස් වීම හඳුනා ගැනීම
කාලය : මිනිත්තු 50 යි

**ගුණාත්මක යෙදුම්**

- වෙනස් වීම් ප්‍රකට කෙරෙන අවස්ථාවන්හි ඡායාරූප, රූප සටහන්, වීඩියෝ ආදිය යොදා ගන්න.
- සුදුසු පරිදි තාක්ෂණික මෙවලම් ද භාවිත කරන්න.

**ක්‍රමය හා ක්‍රමවේදය**

ප්‍රශ්නෝත්තර ක්‍රමය, දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය, අනාවරණ ක්‍රමය, ප්‍රදර්ශනාත්මක ක්‍රමය

**උපදෙස්:**

- දී ඇති රූප සටහන් හොඳින් නිරීක්ෂණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිරීක්ෂණය කළ රූප සටහන්වල වෙනස් වන ස්වභාවය පිළිබඳ ව විමර්ශනයට ලක් කිරීමට ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- වෙනස් වන සංකල්පය පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්:**

- පාඩම ඇසුරෙන් ක්‍රියාකාරකමෙහි තනි තනි ව නිරත වීමට උපදෙස් දෙන්න.
- ''වෙනස්වීම'' යන සංකල්පය පිළිබිඹු වන පරිදි පරිසර සංසිද්ධියක් හෝ ජීවන අත්දැකීමක් ඇසුරෙන් චිත්‍රයක් නිර්මාණය කිරීමට මග පෙන්වන්න.
- අඳින ලද චිත්‍ර කිහිපයක් ගෙන වෙනස්වීම යන සංකල්පය පිළිබඳ ව පැහැදිලි කරමින් සිසුන් සමග සාකච්ඡාවක නිරත වෙන්න.

## 6.2 තිලකුණු හඳුනා ගෙන මැදහත් සිතින් ක්‍රියා කරමු

| | |
|---|---|
| අරමුණ | : බුදුදහමේ මූලික ඉගැන්වීමක් වන ත්‍රිලක්ෂණය සරල ව අර්ථකථනය කර ගැනීම |
| කාලය | : මිනිත්තු 50 යි |

**ගුණාත්මක යෙදුම්**

- වෙනස් වීම් ප්‍රකට කෙරෙන අවස්ථාවන්හි ඡායාරූප, රූප සටහන්, වීඩියෝ ආදිය යොදා ගන්න.
- සුදුසු පරිදි තාක්ෂණික මෙවලම් ද භාවිත කරන්න.

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය, ප්‍රදර්ශනාත්මක ක්‍රමය, ප්‍රශ්නෝත්තර ක්‍රමය

**උපදෙස්:**

- ලබා දී තිබෙන අන්තර්ගතය කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- බුදුදහමේ මූලික ඉගැන්වීමක් වන ත්‍රිලක්ෂණ සංකල්පය පාඩම ඇසුරින් සාකච්ඡා කරන්න.
- එම අදහස තේරුම් ගැනීමට තවත් උදාහරණ කිහිපයක් දරුවන්ගෙන් විමසමින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන පදවල සරල අර්ථය පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම සඳහා උපදෙස්:**

- ත්‍රිලක්ෂණ සංකල්පය පිළිබඳ ව තෝරාගත් සිසුන්ගෙන් වෙන් වෙන් ව විමසන්න.
- ත්‍රිලක්ෂණ සංකල්පය ඇසුරෙන් ක්‍රියාකාරකමෙහි තනි තනිව නිරත වීමට උපදෙස් දෙන්න.
- අහඹු ලෙස තෝරාගත් ශිෂ්‍ය ක්‍රියාකාරකම් කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳව අදහස් දක්වමින් ඌනපූරණ සපයන්න.

# 07. සතර සංග්‍රහ වස්තුවෙන් සැමට සලකමු

ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 7. ශිෂ්‍යයා යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම උදෙසා සතර සංග්‍රහ වස්තු උපයෝගී වන බව විස්තර කරයි. | 7.1 සතර සංග්‍රහ වස්තුවල සමාජමය වටිනාකම සාකච්ඡා කරයි. |

## 7.1 දානය හා ප්‍රියවචන පුහුණු කරමු

අරමුණ : සමාජයේ යහපතට හේතු වන දානය හා ප්‍රිය වචනය දෛනික ජීවිතයේ දී පුරුදු පුහුණු කිරීම

කාලය : මිනිත්තු 50 යි

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශනාත්මක ක්‍රමය

**උපදෙස්:**

- පාඩමට අනුව විෂය අන්තර්ගතය අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
- දානය හා ප්‍රියවචනය යන සංකල්ප දෙන අරුත් ගැන්වෙන ආකාරයට පාඩම් සංවර්ධනය සිදු කරන්න.
- එහිදි දානය යනු කුමක් ද, ඒවායේ ස්වභාවයන් හා ආනිසංස ආදි වැදගත් කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.
- ප්‍රිය වචන කතා කිරීමේ අගය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**ක්‍රියාකාරකම් උපදෙස්**

- පාඩමේ සඳහන් ආකාරයට ක්‍රියාකාරකම සිදු කරන්න.

- එහි දී පෙර පෝය වැඩසටහනක් ලෙස භික්ෂූන් වහන්සේ නමක් හෝ දෙනමක් පන්ති කාමරයට වඩමවා දානමය පිංකමක් දරුවන් සමඟ ප්‍රයෝගිකව සිදු කරන්න.
- විදුහල්පති දැනුවත් කර පන්ති කාමරය තුළ හෝ සුදුසු පරිසරයක දානයමය පිංකමක් සුදානම් කරන්න
- ඊට අදාළව අවශ්‍ය ද්‍රව්‍ය හා සම්පත් සුදානම් කරන්න.

## 7.2 අර්ථචර්යාව හා සමානාත්මතාවෙන් කටයුතු කරමු

අරමුණ : සමාජයේ යහපතට හේතු වන අර්ථචර්යාව හා සමානාත්මතාව දෛනික ජීවිතයේ දී පුරුදු පුහුණු කිරීම

කාලය : මිනිත්තු 50 යි

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශනාත්මක ක්‍රමය

**උපදෙස්:**

- පාඩමට අනුව විෂය අන්තර්ගතය අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
- අර්ථචර්යාව හා සමානාත්මතාව යන සංකල්ප දෙන අරුත් ගැන්වෙන් ආකාරයට පාඩම් සංවර්ධනය සිදු කරන්න.
- සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවා සමාලෝචනයක් සිදු කරන්න.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- සාධු චර්යා පොතක් සැකසීමට උපදෙස් දෙන්න
- දෛනික ජීවිතයේ දී සතර සංග්‍රහ වස්තු භාවිත වූ අවස්ථා ප්‍රත්‍යවේක්ෂණය කරමින් තම පොතේ සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- ඉදිරි දිනයක දී දරුවන්ට සාධු චර්යා පිළිබඳ ව ඉදිරිපත් කිරීමට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

# 08. සම්මා සතියෙන් දිවි ගෙවමු

**ඉගෙනුම් පල හා කාර්යසාධන ප්‍රමිතීන්**

| ඉගෙනුම් පල | කාර්යසාධන ප්‍රමිතීන් |
|---|---|
| 8. ශිෂ්‍යයා සතිමත් බව සංකල්පය තම චරිත සංවර්ධනයට ඉවහල් වන අයුරු ප්‍රත්‍යවේක්ෂණය කරයි. | 8.1 පිළිගත් ආගමික උදාහරණය තුළින් සතිමත් බව ඉදිරිපත් කර ඇති ආකාරය පැහැදිලි කරයි. |
| | 8.2 තම දෛනික ජීවිතය සතිමත් බවෙන් ගත කළ යුතු ආකාරය හඳුනා ගනියි. |

## 8.1 සම්මා සතිය හඳුනා ගනිමු

අරමුණ : මනා සිහියෙන් ක්‍රියා කරමින් සතිමත්ව ජීවත් වීම

කාලය : මිනිත්තු 50 යි

**ගුණාත්මක යෙදුම්**

සතිමත් බව දක්වෙන ඡායාරූප හෝ වීඩියෝ ආදිය යොදා ගන්න.

සුදුසු පරිදි තාක්ෂණික මෙවලම් ද භාවිත කරන්න.

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය, අදර්ශන ක්‍රමය

**උපදෙස්:**

- සතිමත් බව පිළිබඳ ව සිසුන් ව දැනුවත් කරන්න.
- පන්තියේ සියලු ම සිසුන් පාසලේ නිදහස් පරිසරයකට රැගෙන ගොස් හැමදෙනා ම රවුමකට සිටීමට උපදෙස් දෙන්න.
- එම රවුමෙහි එක් තැනක සිට පිළිවෙළින් ගණන් කිරීමට යොමු කරවන්න.
- ඔත්තේ සංඛ්‍යා එක් පෙළකටත්/ඉරට්ටේ සංඛ්‍යා එක් පෙළකටත් වශයෙන් මුහුණට

මුහුණ ලා සිට ගැනීමට සිසුන් යොමු කරවන්න.

- මුහුණට මුහුණ ලා සිටින යහළුවාගෙන් පහත සඳහන් ප්‍රශ්න මතකයෙන් ඇසීමටත්, ඒ සඳහා දෙන පිළිතුරු මතක තබා ගැනීමටත් උපදෙස් දෙන්න.
- අනතුරුව එම යහළුවාට ද තමන්ගේ තොරතුරු මතකයෙන් විමසීමට අවස්ථාව ලබා දී එම තොරතුරු මතකයේ තබා ගැනීමට යොමු කරවන්න.
- ඇසිය යුතු ප්‍රශ්න
    - සම්පූර්ණ නම
    - කැමති ම විෂය
    - අනාගත බලාපොරොත්තු මොනවා ද?
    - කැමති ම ආදර්ශවත් චරිතය කාගේ ද?
    - යහළුවා තුළ ඇති යහපත් ගුණාංග
- එක් කණ්ඩායමක හතරක් වන සේ මෙම ප්‍රශ්න විමසූ තවත් යහළුවන් දෙදෙනෙකු සමග එකතු වී තම යහළුවා පිළිබඳ ඉහත තොරතුරු අනෙක් යහළුවන්ට නිවැරදි ව හා මතකයෙන් හඳුන්වා දීමට අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව ගුරුතුමා විසින් අහඹු ලෙස ශිෂ්‍යයන් තෝරාගෙන ඔවුන්ට තම යහළුවා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- සතර ඉරියව්ව පිළිබඳ පැහැදැලි කිරීමක් කරන්න.
- ක්‍රියාකාරක අවසානයේ දී සිහිය මනාව පිහිටුවා කටයුතු කිරීමත්, සතිමත් ව කටයුතු කිරීමේ වැදගත්කමත් පැහැදිලි කර දෙන්න.

## 8.2 සතිමත් ව ක්‍රියා කරමු

අරමුණ : දෛනික කටයුතුවල දී සම්මාසතියෙන් ජීවත් වීම

කාලය : මිනිත්තු 50 යි

**ක්‍රමය හා ක්‍රමවේදය**

දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ක්‍රියාකාරකම් පාදක ක්‍රමය, අදර්ශන ක්‍රමය

**උපදෙස්:**

- විෂය අන්තර්ගතය අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
- එහිදී ඉරියව් සතර පවත්වා ගැනීම හා එහි ස්වභාවයන් ගැන සාකච්ඡා කරන්න.
- සතිමත් බවින් සෑම මොහොතකම කටයුතු කිරීමෙන් ජීවිතය ජයගත හැකි බව පෙන්වා දෙන්න.
- සතිමත් බවින් තොරව කටයුතු කිරීමෙන් ඇතිව වන ගැටලු පිළිබඳ ව සාකච්ඡා

කරන්න.

- අනතරුව පාඩමෙහි උපදෙස් ලබා දී ඇති ආකාරයට ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**ක්‍රියාකාරකම සඳහා උපදෙස්:**

- සුදුසු සිසුන් කණ්ඩායම්ගත කරන්න.
- ඒ ඒ කණ්ඩායමට විවිධ ඉරියව් පවත්වා ගෙන කටයුතු කිරීමට උපදෙස් දෙන්න.
    - සක්මන් කිරීම
    - කවියක් කීම
    - චිත්‍රයක් ඇඳීම
- එම ක්‍රියා සිදු කරන විට සතිය මැනවින් පිහිටුවාගෙන කටයුතු කිරීමට උපදෙස් දෙති.
- දෛනික ජීවිතයේ සෑම ක්‍රියාකාරකමක දී ම සතිය පිහිටුවීමේ වැදගත් කම පෙන්වා දෙමින් සමාලෝචනයක නිරත වන්න.